# පූසාට පැරදුණු මීයා



සෙතුලි තිසංසා වීරකෝන්

# පූසාව පැරද වූ මීයා

කතාව සහ චිත්‍ර - සෙතුලි තිසංසා වීරකෝන්

කතෘ ගේ වෙනත් කෘති - සුන්දර චාරිකාව 2021 ජනවාරි

ප්‍රථම මුද්‍රණය - දෙසැම්බර් 2023

ISBN : 978-624-206-910-4

# පිදුම

**කන්ද උඩරට මහා පින් භූමිය වූ මහාමායාව නිති සිල් සුවඳින් සුවඳවත් කරන ජාතියේ මුදුන් මල්කඩ වන දළදා සමිඳුන් වෙත සැදැහැ සිතින් මෙම පොත පුද කරමි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගොලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීම යි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්"ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

ඔන්න එකෝමත් එක දවසක පූසෙකුයි, මීයෙකුයි හොදම යාළුවො විදිහට හිටියලු. ඒ දෙන්න ඉතින් හැමදේම එකතු වෙලා කරන හොඳ ම යාළුවො දෙන්නලු.

එක දවසක මේ දෙන්න මුණ ගැසිලා කතා කර කර ඉද්දි මොකක් හරි තරගයක් අපි තියමු ද කියල කතා වුණාලු. ඒ දෙන්නා ඒ ගැන සෑහෙන්න කතා කරල අන්තිමේට එක පාරටම පූස කිව්වලු,



”මේ යාළුවේ, අපි දෙන්න ගුටි කෙලි තරගයක් තියමුද?” කියල මීයගෙන් ඇහුවලු. ඒ වෙලාවේ ටිකක් කල්පනා කර කර හිටපු මී යාළුවා කිව්වලු ”මම තව ටිකක් කල්පනා කරල බලන්න ඕනෙ කියලා.”

එත්කොටම පූස කියනවා ”මම හෙට ට කල් දෙන්නම් කල්පනා කරල කියන්න” කියලා. ඒක අහපු මීයාත් එකග වෙලා උදේන්ම හමු වීමේ පොරොන්දුව උඩ වෙන් වෙලා ගියාලු.

ඔන්න ඉතින් පූසා උදෙන්ම යනව මීයා ගෙ ගෙදරට, ගිහින් ”මී යාළුවේ මම ආවා” කියල දොරට තට්ටු කලා ලූ. මීයා දොර ඇරපු ගමන්ම ඇදුම් මාරු කරගෙන එන්න දුවගෙන ගියාලූ. ඊට

පස්සෙ මීයා ඉක්මනටම ඇදුම් මාරු කරගෙන දොර ලගට ගියා.

එතකොට පූසා ඇහුවා, "ඔයා කැමතියිද ර්යෙ මම කියපු ගුටි කෙලි තරගයට එන්න?" කියල. හැබැයි ඒ වෙලාවෙ කල්පනා කරපු බුද්ධිමත් මීයා කිව්වා, "මමත් කැමතියි. ඒත් මට සූදානම් වෙන්න දවස් දහයක් දෙන්න පුලුවන්ද?" කියල.



මීයා කියපු දේ ටික වෙලාවක් කල්පනා කරපු පූස් හාමි කියනව "එහෙනම් මම දවස් දහයක් දෙන්නම්කො" කියලා. එහෙනම් අපි දවස් දහයකින් හම්බ වෙමු කියල දෙන්නම වෙන් වෙලා ගියාලු.

මීයා මේ දවස් දහය ම හොදට පුරුදු පුහුණු වුණාලු. හැබැයි කම්මැලි පූස් හාමි නම් මුළු දවස් දහය ම නිදාගන්න එක තමයි කලේ.

ඔන්න ඉතින් දවස් ටික ගෙවිල ගිහින් ගුටි කෙළිය පටන් ගන්න දවස ආවා. එදා ඔක්කොම බලාගෙන ඉද්දි ඔන්න ගුටි කෙළියත් පටන් ගත්තා. හැබැයි ටික වෙලාවක් යද්දි පූසාට නම් ගොඩක් මහන්සියි වගේ. හේතුව මොකද දන්නවද පූසා කලේ මහ ගොඩක් කාල බීල නිදාගන්න එක විතරයි නේ. ඒත්

මීය ට එහෙම මහන්සියක් වත් නෑ, මොකද එයා හොදට අන්තිම දවස් ටිකේ පුරුදු වුණ නිසා.




අන්තිමේට තරගයෙන් කිසිම මහන්සියක් නැතුවම මීයා ජයග්‍රහණය කලා.

හැබැයි තරගය ඉවර උනාට පස්සෙ මීය ගාවට ආව පූසා හෙම්හිට මීය ගෙන් අහනවා. ”මගෙ මී

මිතුරේ, මෙච්චර ලොකු මාව කොහොමද ඔයා පරාජය කලේ" කියලා.

ඉතින් මීයත් එයා පුරුදු පුහුණු වෙච්ච විදිහ පූසට කිව්වට පස්සෙ ඉතාම සතුටු වෙච්ච පූසා එයාට තෑග්ගක් විදිහට ලොකුම ලොකු චීස් කෑල්ලක් දුන්නලු. ඊට පස්සෙ දෙයක් කරනව නම් හොදට කලින්ම පුහුණු වීම වැදගත් කියල තේරුම් ගත්ත යාළුවෝ දෙන්නම සතුටින් වෙන් වෙලා ගියාලු.



නිමි



# පසු වදන

නූතන තාක්ෂණීක මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම  ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්  රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින්  අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරයේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු . .

මෙයට

සෙනෙවිරත්න

මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01